**ඒරාවූර් නගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 30 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පළාත් සභා ණය හා සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ණය පොළී රු.417,285ක් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 84,739,626 | ඉඩම් හිමිකම් ඔප්පු |
| (ii) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 4,255,593 | ස්ථාවර වත්කම් ලේඛන |
| (iii) | මෝටර් වාහන | 2,492,615 | |
| (iv) | ලී බඩු | 3,150,200 | |

#### 1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 177(2) වගන්තිය ප්‍රකාරව නගර සභාවේ 2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සාරාංශය ඊළඟ මාර්තු මාසයේ පළමුවන දිනට ප්‍රථම රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 1,931,239 කි. ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් රු.258,607 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ දුර්වලතා

ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ රු.18,395 ක හිඟ ණය ශේෂය වර්ෂ 04 ක කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

එරාවූර් නගරයේ ඇති එක් මාර්ගයක කියුබික් මීටර් 71.2 ක ප්‍රමාණයක කොන්ක්‍රීට් දමා තිබුණත්, එම මාර්ගයට කියුබික් මීටර් 79.38 ක ප්‍රමාණයක කොන්ක්‍රීට් දමා තිබූ බවට තාක්ෂණික නිලධාරියා විසින් සහතික කිරීමෙන් පසුව රු.1,078,774 ක මුදලක් ගෙවීම් කර තිබූ බැවින් කොන්ත්‍රාත්කරුට රු.111,166 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 4.. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

## 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | අන්තර්ගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 4.1(ආ) | අබලන් තත්ත්වයේ පැවැති ට්‍රැක්ටර් යන්ත්‍ර සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| 2015 | 3.2.3 | සිනමා ශාලාවෙන් විනෝද බදු අයකිරීමට කටයුතු නොකිරීම. |
| 2015 | 3.2.2 | සේවකයින්ට ලබා දී තිබූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |

## 4. 2 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම.<br>(ii) භාවිතා නොකර නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |